# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2191/26 - 2020 සැප්තැම්බර් මස 03 වැනි බ්‍රහස්පතින්දා - 2020.09.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත**

2 වැනි වගන්තිය යටතේ නියමය

2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල්, අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මම, මෙහි උපලේඛනයේ I වන තීරයේ නිශ්චිතව දක්වා ඇති වෙළඳ භාණ්ඩ සම්බන්ධයෙන් ඒ උපලේඛනයේ II වන තීරයේ අනුරූප සටහන් වල නිශ්චිතව දක්වා ඇති අනුප්‍රමාණය මත විශේෂ වෙළඳ භාණ්ඩ බද්දක්, මෙම නියමය මගින් පනවමි.

මෙම නියමය 2020 සැප්තැම්බර් මස 04 වැනි දින සිට ආරම්භ වන මාස 06ක් දක්වා වූ කාල සීමාවක් සඳහා, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන වලට යටත්ව, වලංගුව පැවතිය යුතු ය.

2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ පනවන ලද 2020.03.07 දිනැති අංක 2165/73 දරන අති විශෙෂ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශිත අදාළ නියමය 2020 සැප්තැම්බර් මස 04 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි අවලංගු කරමි.

**මහින්ද රාජපක්ෂ,**
මුදල් අමාත්‍ය.

2020 සැප්තැම්බර් මස 03 වැනි දින,
කොළඹ 01,
මුදල් අමාත්‍යාංශයේ දී ය.

1A - PG 5123 — 569 (2020/09)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## උපලේඛනය

| I වැනි තීරය | | | | II වැනි තීරය |
|---|---|---|---|---|
| වෙළඳ භාණ්ඩය | | | | |
| | සං. ව. ශීර්ෂය | සං. ව. සංකේතය | විස්තරය | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද |
| 1 | 03.02 | | 03.04 ශීර්ෂයේ කටු ගැලවූ මසුන් සහ අනෙකුත් මසුන්ගේ මස් හැර, අළුත් හෝ ශීතකළ මසුන් | 10% හෝ කි. ග්‍රෑමයට රු. 150 යන දෙකෙන් වඩා වැඩි බදු ප්‍රමාණය |
| | 03.03 | | 03.04 ශීර්ෂයේ කටු ගැලවූ මසුන් සහ අනෙකුත් මසුන්ගේ මස් හැර, හිමායිත මසුන් (රේගු සං.ව. සංකේතාංක 0303.54 යටතට වැටෙන මැකරල් මසුන් සහ රේගු සංකේතාංක 0303.55 යටතට වැටෙන ජැක් මැකරල් (Jack and horse mackerel - *Trachurus* spp./ මසුන් හැර) | 10% හෝ කි. ග්‍රෑමයට රු. 150 යන දෙකෙන් වඩා වැඩි බදු ප්‍රමාණය |
| 2 | 03.03 | 0303.54 | මැකරල් (ස්කොම්බර් ස්කොම්බුස්, ස්කොම්බර් ඔස්ට්‍රාලයිකස්, ස්කොම්බර් ජැපොනිකස්) | කි. ග්‍රෑමයකට රු. 6.00 |
| | | 0303.55 | ජැක් හා හෝස් මැකරල් (Jack and horse mackerel - *Trachurus* spp./) | කි. ග්‍රෑමයකට රු. 6.00 |
| 3 | 0713 | 0713.31.22 | උඳු ඃ පිට කුරුට්ට ඉවත් කළ, පියළි කළ හෝ පියළි නොකළ | කි. ග්‍රෑමයකට රු. 300.00 |
| | | 0713.31.29 | උඳු ඃ අනෙකුත් | කි. ග්‍රෑමයකට රු. 200.00 |
| 4 | | 0713.35.90 | අනෙකුත් - කව්පි | කි. ග්‍රෑමයකට රු. 70.00 |
| 5 | 10.08 | 1008.21.10 | බීජ - කුරක්කන් (ඉලියුසිනේ කොරකාන විශේෂ) | කි. ග්‍රෑමයකට රු. 70.00 |
| | | 1008.21.90 | බීජ - අනෙකුත් (මිලට්) | කි. ග්‍රෑමයකට රු. 70.00 |
| | | 1008.29.10 | අනෙකුත් - කුරක්කන් (ඉලියුසිනේ කොරකාන විශේෂ) | කි. ග්‍රෑමයකට රු. 70.00 |
| | | 1008.29.90 | අනෙකුත් (මිලට්) | කි. ග්‍රෑමයකට රු. 70.00 |

09 - 447

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.